චක්‍රලේඛ අංක: ශ- 2003/28


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary } 784811

කාර්යාලය / அலுவலகம் / Office } 785141-50, Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : secedu@sltnet.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு

Ministry of Human Resources Development, Education & Cultural Affairs

පාසල් කටයුතු ශාඛාව

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.

'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை, பத்தரமுல்ல.

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } ඊඩී/01/12/01/04/03

දිනය / திகதி / Date } 2003.07.03

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

## පාසල් පුස්තකාල සඳහා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය පොත් මිළදී ගැනීම

දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියේ මූල්‍ය ආධාර මගින් පාසල් පුස්තකාල සංවර්ධනය කිරීමට තෝරා ගත් පාසල් 4000 ක් සඳහා සිංහල/දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පුස්තකාල පොත් මිළදී ගැනීමේ වැඩපිළිවෙළ අනුව සිංහල මාධ්‍ය පාසල් 2596ක ට පොත් සපයා ඇත. සිංහල මාධ්‍ය පුස්තකාල පොත් ලබා නොදුන් පාසල් 528 ක් සඳහා පොත් මිළදී ගැනීමට ද පාසල් 4000 ක් සඳහා ද්විතීයික මට්ටමේ ඉංග්‍රීසි මාධ්‍ය පොත් මිළදී ගැනීමට ද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව ඔබ පළාතට එවන ලද මුදල් සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කිරීම සඳහා මෙයින් දන්වමි.

01. පාසල් පුස්තකාල පොත් මිළදී ගැනීම සම්බන්ධව සේවා/පාපුස/මුදල්9(පු.පො.) අංක දරන 2002.12.12 දිනැති ලිපියෙන් සහ Ser/SLDU/Admin II(L.B) අංක දරන 2003-03-26 දිනැති, පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ අධ්‍යක්ෂකගේ අත්සනින්, මෙම අමාත්‍යාංශ ප්‍රතිපත්තිවලට පටහැනිව නිකුත් කර ඇති උපදෙස් ලිපිය මෙයින් අහෝසි කරමි.

02. ඉහත Ser/SLDU/Admin II(L.B) අංක දරන 2003-03-26 දිනැති ලිපියට සම්බන්ධ සමාංක හා 2003-01-09 දිනැති ලිපිය හා ඊට අදාළව සමාංක සහිත 2003-02-19 දිනැති පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ අධ්‍යක්ෂකගේ ලිපිය මගින් දී ඇති උපදෙස් හා ඊට අමුණා ඇති පොත් ප්‍රකාශකයන්ගේ හා පොත් වෙළඳුන්ගේ නම් ලැයිස්තුව ද ඒ අනුව අහෝසි කරමි.

03. මේ වන විට පාසල්වලින් පුස්තකාල පොත් මිළදී ගෙන නොමැති නම් මින් පසු මිළදී ගැනීමේදී මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද HRD/PPM/2002/30 අංක දරන 2002-12-04 දිනැති අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිළයට ගැනීම හා බෙදා හැරීම පිළිබඳ චක්‍රලේඛය අනුව සහ ඊට අදාළ මාර්ගෝපදේශ අත්පොතෙහි උපදෙස් අනුගමනය කිරීමට විදුහල්පතිවරුන් වෙත උපදෙස් දෙන්න.

04. සේවා/පාපුස/මුදල්9(පු.පො.) අංක දරන 2002-12-12 දිනැති ලිපිය මගින් සිංහල පොත් මිළදී ගැනීම සඳහා වෙන් කරන ලද මුදල් මෙතෙක් පාසල්වලට ලබා දී නොමැති නම් වහාම එම මුදල් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් විදුහල්පතිවරුන් වෙත ලබා දී පොත් මිළදී ගැනීමට උපදෙස් ලබා දෙන්න.

05. Ser/SLDU/Admin II(L.B) අංක දරන 2003-03-26 දිනැති ලිපිය මගින් ද්විතියික මට්ටමේ ඉංග්‍රීසි මාධ්‍ය පොත් මිළ දී ගැනීමට ලබා දී ඇති මුදල් තවදුරටත් අධ්‍යාපන කාර්යාලවල රඳවා ගෙන ඇත්නම් එම මුදල් ද වහාම විදුහල්පතිවරුන් වෙත ලබා දී පුස්තකාල පොත් මිළදී ගැනීම සඳහා උපදෙස් ලබා දෙන්න.

වී.කේ. නානායක්කාර
ලේකම්
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පිටපත් -
1. ලේකම්, පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය - දැ.ග.ස.
2. පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - අ.ක.ස.
3. පළාත් අධ්‍යාපන ප්‍රධාන ගණකාධිකාරීවරුන් - වහාම, අදාළ මුදල් කලාප අධ්‍යක්ෂවරුන් මගින් පාසල් වෙත යැවීම සඳහා
4. විගණකාධිපති - දැ.ග.ස.